විශේෂාංගය :

# නුවරඑළි දිස්ත්‍රික්කයේ වී වගාව පිළිබඳ විමසුමක්


එම්. එම්. ජයතිස්ස කුමාර
ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

**නුවරඑළිය දිස්ත්‍රික්කයේ වාර්ෂික වර්ෂාපතනය දළ වශයෙන් මි. මී. 1500 - 2300 ක් වන අතර උස මුහුදු මට්ටමේ සිට අඩි 2000 ට වැඩිය. උෂ්ණත්වය $15^0$ - $20^0$ පමණ වේ. නුවරඑළිය දිස්ත්‍රික්කයෙහි දේශගුණය ලංකාවේ අනෙකුත් ප්‍රදේශවලට වඩා පැහැදිලිවම වෙනස්ය. නුවරඑළිය දිස්ත්‍රික්කයෙහි වර්ෂාපතනය ලංකාවේ අනෙකුත් ප්‍රදේශවලට වඩා පැහැදිලිවම වෙනස්ය. නුවරඑළිය දිස්ත්‍රික්කයෙහි වර්ෂාපතනය ලංකාවේ අනෙකුත් ප්‍රදේශවලට වඩා වැඩි අතර. උෂ්ණත්වය අනෙකුත් ප්‍රදේශවලට වඩා අඩුය.**

ජන ලේඛණ හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව 1990/91 මහ කන්නයේ ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක අටක වී වගාව පිළිබඳ සංඛ්‍යා ලේඛණ ඉදිරිපත් කර ඇත. මෙම සංඛ්‍යා ලේඛණ වල මෙම ප්‍රදේශ තුළ වී වපුරන ලද බිම් ප්‍රමාණය කපා ගන්නා ලද දළ හා ශුද්ධ බිම් ප්‍රමාණය සාමාන්‍ය අස්වැන්න හා නිෂ්පාදනය යන කරුණු පිළිබඳව දත්ත අඩංගුවේ.


නුවරඑළිය දිස්ත්‍රික්කයෙහි දළ වශයෙන් වපුරන ලද මුළු බිම් ප්‍රමාණය හෙක්. 6171 කි. එයින් වාරිමාර්ග ක්‍රම යටතේ හෙක්ටයාර් 942 ක් වගා කරයි. එය මුළු බිම් ප්‍රමාණයෙන් 15% කි. සුළු වාරිමාර්ග ක්‍රම යටතේ හෙක්ටයාර් 5115 ක් වගා කරයි. එය මුළු බිම් ප්‍රමාණයෙන් 82% ක් පමණ වේ. වර්ෂා පෝෂිතව හෙක්ටයාර් 115 ක් වගා කරයි. එය මුළු බිම් ප්‍රමාණයෙන් 1.8% කි. ඒ අනුව බලන විට නුවරඑළිය දිසත්‍රික්කයේ වැඩිම ප්‍රමාණයක් වගා කරනුයේ සුළු වාරිමාර්ග ක්‍රම යටතේය.

**දළ වශයෙන් වපුරන ලද බිම් ප්‍රමාණය (හෙක්ටයාර්)**




නුවරඑළිය දිස්ත්‍රික්කයේ දළ වශයෙන් කපා ගත් මුළු බිම් ප්‍රමාණය හෙක්ටයාර් 6165 කි. ඉන් විශාල වාරිමාර්ග ක්‍රම යටතේ හෙක්ටයාර් 938 කපා ගෙන ඇත. එය මුළු බිම් ප්‍රමාණයෙන් 82.09% කි. වර්ෂාපෝෂිතව හෙක්ටයාර් 115 ක් කපා ගනී. එය මුළු බිම් ප්‍රමාණයෙන් 1.8 කි.

**දළ වශයෙන් කපා ගත් බිම් ප්‍රමාණය (හෙක්ටයාර්)**




නුවරඑළිය දිස්ත්‍රික්කයේ ශුද්ධ හෙක්ටයාර් එකකට සාමාන්‍ය අස්වැන්න සලකා බැලූ විට විශාල වාරිමාර්ග ක්‍රම යටතේ අස්වැන්න කි. ග්‍රෑ. 4627 ක් ද, සුළු වාරිමාර්ග ක්‍රම යටතේ කි. ග්‍රෑ. 3802 ද ලබා ගනී. වර්ෂා පෝෂිතව කි. ග්‍රෑ. 2790 ලබා ගනී. මෙහි සාමාන්‍ය කි. ග්‍රෑ. 3474 කි.

ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුවේ 90/91 මහ කන්නයේ ප්‍රකාශයන් වලට අනුව ලංකාවේ ප්‍රදේශ අටක දළ වශයෙන් වපුරා ඇති මුළු බිම් ප්‍රමාණය සලකා බැලූ විට හෙක්ටයාර 422283 කි. නුවරඑළිය දිස්ත්‍රික්කයට එයින් හෙක්ටයාර් 6171 අයත් වේ. එය මුළු ප්‍රමාණයෙන් 1.5 කි. මෙම ප්‍රදේශ 20 හි විශාල වාරිමාර්ග වලින් වපුරන මුළු බිම් ප්‍රමාණය දළ වශයෙන් හෙක්ටයාර් 191212 කි. නුවරඑළිය දිස්ත්‍රික්කයට එයින් හෙක්ටයාර් 942 ක් අයත් වේ. එය මුළු බිම් ප්‍රමාණයෙන් 0.5% කි.

මෙම ප්‍රදේශ 20 හි සුළු වාරිමාර්ග ක්‍රම අනුව වගා කරන මුළු බිම් ප්‍රමාණය හෙක්ටයාර් 107111 කි. නුවරඑළිය දිස්ත්‍රික්කයට එයින් හෙක්ටයාර් 5115 අයත් වේ. එය මුළු බිම් ප්‍රමාණයෙන් 4.7% කි.

19 පිටුවට ➪


**නුවරඑළිය දිස්ත්‍රික්කයේ .....**
17 පිටුවෙන්

වර්ෂාපෝෂිතව මෙම ප්‍රදේශ 20 හි වගා කරන ලද මුළු බිම් ප්‍රමාණය 123960 කි. එයින් නුවරඑළිය දිස්ත්‍රික්කයට හෙක්ටයාර් 115 අයත් වේ. එය මුළු බිම් ප්‍රමාණයෙන් 0.1% කි.

එලෙසම ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුවේ 1991/92 මහ කන්නයේ ප්‍රකාශ වලට අනුව මෙම ප්‍රදේශ වල අස්වනු කපා ගත් බිම් ප්‍රමාණය 416987 කි. නුවරඑළිය දිස්ත්‍රික්කයට එයින් හෙක්ටයාර් 6165 අයත් වන අතර එය මුළු බිම් ප්‍රමාණයෙන් 1.4% කි. එම බිම් ප්‍රමාණයෙන් නුවරඑළිය දිස්ත්‍රික්කය විශාල වාරිමාර්ග ක්‍රම වලින් හෙක්ටයාර් 938 ක අස්වනු කපා ගන්නා අතර එය මුළු ප්‍රමාණයෙන් 5% කි.


සුළු වාරිමාර්ග ක්‍රම වලින් හෙක්ටයාර් 5111 ක අස්වැන්නක් කපා ගනී. එය මුළු බිම් ප්‍රමාණයෙන් 4.8% කි. වර්ෂාපෝෂිතව වගා කරන බිම් ප්‍රමාණය හෙක්ටයාර් 115 කි. එය මුළු බිම් ප්‍රමාණයෙන් .% කි.

**දළ වශයෙන් කපා ගන්නා හා වපුරණ ලද බිම් ප්‍රමාණය**




ඉහත ප්‍රස්ථාරයෙන් පෙන්වනුයේ ප්‍රදේශ 20 ක දළ වශයෙන් වපුරණ ලද බිම් ප්‍රමාණය හා දළ වශයෙන් කපා ගන්නා බිම් ප්‍රමාණයයි. ඒ අනුව නුවරඑළිය ප්‍රදේශයේ අනෙක් ප්‍රදේශවලට සාපේක්ෂව අඩු වැපිරීමක් සහ අඩු අස්වැන්නක් පෙන්වයි.

**දළ වශයෙන් කපා ගත් බිම් ප්‍රමාණය (හෙක්ටයාර්)**




ඉහත සඳහන් වන්නේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ 1981 සිට 1991 දක්වා වී වගා කරන ලද බිම් ප්‍රමාණය හා එහි වී නිෂ්පාදනය දැක්වෙන ප්‍රස්ථාරයකි. එම විචල්‍යයන් දෙකෙහිම ක්‍රමානුකූල වූ අඩුවීමක් පෙන්නුම් කරයි.

මෙයින් අනුමාන කළ හැක්කේ නිෂ්පාදන වියදම් අධික වී වගාවේ සිට මිල අධික එළවළු වගාව කරා ගොවියා ක්‍රමයෙන් සංක්‍රමණය වෙමින් සිටින බවයි.

# වී පිළිබඳ සංඛ්‍යාලේඛන - 1990/91 මහ කන්නයේ වපුල, කපා ගන්නා ලද දළ හා ශුද්ධ බිම් ප්‍රමාණයන්, සාමාන්‍ය අස්වැන්න හා නිෂ්පාදනය (දිස්ත්‍රික්ක මට්ටමින්)

| දිස්ත්‍රික්කය වාරිමාර්ග | දළ වශයෙන් වපුරන ලද බිම් ප්‍රමාණය | | | | දළ වශයෙන් කපාගත් බිම් ප්‍රමාණය | | | | ශුද්ධ හෙක්ටයාරයට සාමාන්‍ය අස්වැන්න කි. ග්‍රෑ. | | | | කපාගත් මුළු බිම් ප්‍රමාණය (ශුද්ධ) | සම්පූර්ණ නිෂ්පාදනය මෙට්‍රික් ටොන් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | විශාල වාරිමාර්ග | සුළු වාරිමාර්ග | වර්ෂා පෝෂිත | මුළු බිම් ප්‍රමාණය | විශාල වාරිමාර්ග | සුළු වාරිමාර්ග | වර්ෂා පෝෂිත | මුළු බිම් ප්‍රමාණය | විශාල වාරිමාර්ග | සුළු වාරිමාර්ග | වර්ෂා පෝෂිත | සාමාන්‍ය | හෙක්ටයාර් | දහස් ගණනින් |
| 1. කොළඹ | - | 856 | 5491 | 6346 | - | 856 | 5488 | 6344 | - | 2938 | 2976 | 2970 | 5392 | 16 |
| 2. ගම්පහ | 1507 | 2320 | 10212 | 14039 | 1506 | 2296 | 10122 | 13924 | 2657 | 2683 | 2639 | 2648 | 11835 | 31 |
| 3. කළුතර | 419 | 2817 | 14726 | 17961 | 416 | 2814 | 14688 | 17918 | 2222 | 2592 | 2772 | 2731 | 16529 | 45 |
| 4. ගාල්ල | - | 115 | 19482 | 19597 | - | 114 | 19431 | 19545 | - | 2575 | 2635 | 2635 | 15296 | 40 |
| 5. මාතර | 4011 | 3946 | 10301 | 18259 | 3968 | 3914 | 10255 | 18136 | 3037 | 2823 | 2515 | 2696 | 14319 | 39 |
| 6. රත්නපුර | 1422 | 8578 | 5087 | 15087 | 1398 | 8417 | 5012 | 14827 | 4719 | 2794 | 2681 | 2937 | 12603 | 37 |
| 7. කෑගල්ල | - | 2552 | 8507 | 11059 | - | 2550 | 8496 | 11046 | - | 3507 | 3437 | 3453 | 10348 | 36 |
| 8. කුරුණෑගල | 11539 | 28520 | 28902 | 68961 | 11527 | 28484 | 28823 | 68835 | 4201 | 3742 | 3264 | 3619 | 68835 | 249 |
| 9. පුත්තලම | 3607 | 6246 | 1248 | 11101 | 3515 | 6077 | 1219 | 10811 | 3386 | 3251 | 2061 | 3161 | 9189 | 29 |
| 10. මහනුවර | 4094 | 8144 | 6917 | 19155 | 4093 | 8137 | 6913 | 19143 | 4506 | 3325 | 2770 | 3377 | 15138 | 51 |
| 11. මාතලේ | 4398 | 6875 | 3017 | 14291 | 4396 | 6865 | 3017 | 14277 | 4342 | 4698 | 4306 | 4506 | 12839 | 53 |
| 12. නුවරඑළිය | 942 | 5115 | 115 | 6171 | 938 | 5111 | 115 | 6165 | 4627 | 3802 | 2790 | 3908 | 3474 | 14 |
| 13. බදුල්ල | 9713 | 8826 | 1704 | 20243 | 9706 | 8814 | 1637 | 20157 | 3824 | 4304 | 3392 | 3999 | 17133 | 69 |
| 14. මොණරාගල | 5415 | 4507 | 3035 | 12957 | 5406 | 4476 | 2865 | 12747 | 4573 | 3597 | 2978 | 3872 | 12492 | 48 |
| 15. අනුරාධපුරය | 16487 | 14037 | 541 | 31065 | 16176 | 13205 | 482 | 29864 | 4313 | 3882 | 2723 | 4096 | 24013 | 98 |
| 16. පොළොන්නරුව | 41669 | 526 | 1465 | 43659 | 41634 | 516 | 1278 | 43428 | 4492 | 3489 | 3083 | 4438 | 38416 | 170 |
| 17. අම්පාර | 37859 | 596 | 2214 | 40669 | 35954 | 593 | 2096 | 38643 | 3669 | 2739 | 3224 | 3630 | 36932 | 134 |
| 18. හම්බන්තොට | 14103 | 2535 | 996 | 17635 | 13849 | 2373 | 929 | 17151 | 4640 | 3898 | 3112 | 4455 | 14985 | 67 |
| 19. උඩවලව | 10595 | - | - | 10595 | 10595 | - | - | 10595 | 5093 | - | - | 5093 | 9005 | 46 |
| 20. මහවැලි 'එච්' | 23432 | - | - | 23432 | 23432 | - | - | 23432 | 5594 | - | - | 5594 | 21014 | 118 |
| එකතුව | 191212 | 107111 | 123960 | 422283 | 188510 | 105612 | 122865 | 416987 | 4379 | 3625 | 2942 | 3772 | 369789 | 1395 |
| 21. යාපනය | | | | | | | | | | | | | | |
| 22. කිලිනොච්චිය | | | | | | | | | | | | | | |
| 23. වවුනියාව | | | | | | | | | | | | | | |
| 24. මුලතිව් | | | | | | | | | | | | | | |
| 25. මන්නාරම | | | | | | | | | | | | | | |
| 26. ත්‍රිකුණාමලය | | | | | | | | | | | | | | |
| 27. මඩකලපුව | | | | | | | | | | | | | | |
| ශ්‍රී ලංකාව | | | | 500509 | | | | 482748 | | | | 3620 | 429318 | 1554 |

* මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව